සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (II) (2021)


## (03) කාලීන ප්‍රවණතා

පැය එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

0 1 2 3 4 5 6 7 8 9

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න

...................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

...................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය, පිටු 06 කින් හා ප්‍රශ්න 50කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 13 | |
| 3 | 14 - 25 | |
| 4 | 26 - 36 | |
| 5 | 37 - 43 | |
| 6 | 44 - 50 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | | |
|---|---|---|
| උත්තර පත්‍රය | ලකුණු කළේ | |
| | පරීක්ෂා කළේ | |
| | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● අංක **1** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

**1.** පළාත් සභා ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ කී වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ද?
(1) දස වැනි සංශෝධනය (2) දහතුන් වැනි සංශෝධනය
(3) දහනව වැනි සංශෝධනය (4) විසි වැනි සංශෝධනය (………)

**2.** අතීතයේ පර්සියාව නමින් හැඳින්වූ රට අද හැඳින්වෙන්නේ කවර නමකින් ද?
(1) ඊජිප්තුව (2) ග්‍රීසිය (3) ඉරානය (4) ඉරාකය (………)

**3.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ කුමන නගරයක ද?
(1) නිව්යෝර්ක් (2) වොෂින්ටන් (3) මැනිලා (4) බැංකොක් (………)

**4.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තරුණ කටයුතු ලේකම් කවු ද?
(1) චාල්ස් ෆයිසාර් (2) ඔස්ලෙට් තුරෙයි
(3) ඇන්ටෝනියෝ ගුටේරස් (4) ජයත්මා වික්‍රමනායක (………)

**5.** චීනයේ රාජ්‍ය භාෂාව කුමක් ද?
(1) මැන්ඩරීන් (2) චීන (3) අයිනු (4) කන්ජි (………)

**6.** ලෝකයේ මාධ්‍ය නිදහස අඩුම රට වශයෙන් හැඳින්වෙන්නේ කවරක් ද?
(1) උතුරු කොරියාව (2) දකුණු කොරියාව (3) චීනය (4) රුසියාව (………)

**7.** ලංකාව තුළ සර්ව ජන ඡන්ද බලය ස්ථාපනය කරන ලද්දේ පහත සඳහන් කවර විධි විධාන යටතේ ද?
(1) සෝල්බරි කොමිෂන් සභා වාර්තාව
(2) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(3) ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව
(4) ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (………)

**8.** ලෝක රතු කුරුස දිනය වශයෙන් හැඳින්වෙන්නේ වර්ෂයේ කවර දිනය ද?
(1) මාර්තු 08 (2) මැයි 08 (3) ජුනි 23 (4) ඔක්තෝබර් 01 (………)

**9.** ශ්‍රී ලංකාවේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කළ කොමිෂන් සභාව වන්නේ,
(1) මැතිවරණ කොමිෂන් සභාවයි.
(2) තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවයි.
(3) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවයි.
(4) රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි. (………)

**10.** කෘෂිකාර්මික උපදෙස් ලබාදීම පිණිස ක්‍රියාත්මක වන ක්ෂණික දුරකථන අංකය කුමක්ද?
(1) 1990 (2) 1929 (3) 1920 (4) 1919 (………)

**11.** ඒකාබද්ධ සේවාවක් මෙන් ම දීප ව්‍යාප්ත සේවාවක් ද වන්නේ,
(1) ශ්‍රී ලංකා පරිපාලන සේවයයි. (2) ශ්‍රී ලංකා පුස්තකාලාධිපති සේවයයි.
(3) ශ්‍රී ලංකා පරිපූරක වෛද්‍ය සේවයයි. (4) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයයි. (………)

**12.** ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ දිස්ත්‍රික්කයක් නොවන්නේ,
(1) යාපනය ය. (2) වවුනියාව ය. (3) මුලතිව් ය. (4) කන්කසන්තුරේ ය. (………)

**13.** සාමාන්‍ය 'ජලය' තුළ අඩංගු මූලද්‍රව්‍ය මොනවා ද?
(1) ඔක්සිජන් හා නයිට්‍රජන් (2) ඔක්සිජන් හා හයිඩ්‍රජන්
(3) කාබන් හා හයිඩ්‍රජන් (4) ඔක්සිජන්, හයිඩ්‍රජන් හා කාබන් (………)

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

විභාග අංකය :........................

**14.** ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහයේ කතුවරයා වන්නේ,

(1) මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. (2) මහගමසේකර මහතා ය.
(3) කේ. ජයතිලක මහතා ය. (4) ඒ.වී. සුරවීර මහතා ය. (.........)

**15.** මුල්ම රූපවාහිනිය නිපද වූ පුද්ගලයා වන්නේ,

(1) ජෝන් ලොගී බෙයාර්ඩ් ය. (2) ගුග්ලි එල්මෝ මාකෝනි ය.
(3) කොන්රඩ් රොන්ජන් ය. (4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් ය. (.........)

*(ලකුණු 01 × 15 = 15 යි)*

● ප්‍රශ්න අංක **16** සිට **25** තෙක් එක් එක් හිස්තැන සම්පූර්ණ කිරීම සඳහා වඩාත් සුදුසු වචනය දී ඇති වචන ලැයිස්තුවෙන් තෝරා එය අදාළ හිස්තැන තුළ ලියන්න. එක් වචනයක් එක් අවස්ථාවක් සඳහා පමණක් භාවිත කළ යුතු ය.

සංවර්ධනයෙහි ලා කාන්තාව යන්න අද ලොව පුරා පුද්ගල වශයෙන් මෙන් ම **(16)**........................ සංවිධානවල ද සාකච්ඡාවට ලක්වන විෂයයකි. වර්ෂ 2016 සිට 2030 දක්වා කාලය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති **(17)**........................ සංවර්ධන ඉලක්ක අතර ද කාන්තාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ. කාන්තාවන්ගේ පොදු **(18)**........................ වන්නේ සංවර්ධන ක්‍රියාදාමයේ දී තමන්ට වෙනස්කමක් සිදුව ඇති බව හා ඉඩම්, ණයපහසුකම් ආදි **(19)**........................ කෙරෙහි තමන්ට වඩා වැඩි පිවිසුමක් **(20)**........................ ඇති බවයි. සියලු සම්පත්වලට සමාන **(21)**........................ තිබිය යුතු බව ඔවුහු පවසති. වඩාත් වැදගත් වන්නේ **(22)**........................ යි. එය සමාන අවස්ථා අත් කර ගැනීම සඳහා වන **(23)**........................ අවශ්‍යතාවයකි. එසේම අනෙකුත් බොහෝ සම්පත් පිළිබඳ **(24)**........................ කළමනාකරණය සඳහා **(25)**........................ සපයන්නේ ද එයයි.

| | |
|---|---|
| සම්පත් | ජාත්‍යන්තර |
| පූර්ව | අධ්‍යාපනය |
| තිරසර | චෝදනාව |
| පදනම | පුරුෂයන්ට |
| පිවිසුමක් | විධිමත් |

*(ලකුණු 02 × 10 = 20 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

- ප්‍රශ්න අංක **26** සිට **35** දක්වා ප්‍රශ්නවලට සපයා ඇති කඩ රේඛාව මත පමණක් පිළිතුරු ලියන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

**26.** ප්‍රථම කාර්මික විප්ලවයට පදනම වූ 'වාෂ්ප එන්ජිම' මුලින්ම නිෂ්පාදනය කළේ කවුරුන් ද?

........................................................................................................................

**27.** දෙවන කාර්මික විප්ලවය කෙරෙහි බලපෑ ප්‍රධානතම නව සොයා ගැනීම කුමක් ද?

........................................................................................................................

**28.** විශ්ව ගම්මානය (Global Village) යන්නෙන් කුමක් අදහස් කෙරෙන්නේ ද?

........................................................................................................................

**29.** මාර්ක් සකර්බර්ග් (Mark Zuckerberg) යනු කවුරුන් ද?

........................................................................................................................

**30.** ශ්‍රව්‍ය දෘශ්‍ය සම්මේලන (Video Teleconferencing) සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ මේ වන විට සුලභව භාවිත වන එක් මෘදුකාංගයක් නම් කරන්න.

........................................................................................................................

**31.** රාජ්‍ය සේවයේ 'තුන් දා නීතිය' යනු කුමක් ද?

........................................................................................................................

........................................................................................................................

**32.** රාජ්‍ය සේවයේ 'සත් දින' නීතිය යනු කුමක් ද?

........................................................................................................................

........................................................................................................................

**33.** රාජ්‍ය සේවයේ පුහුණු අවශ්‍යතා පිළිබඳව අවධාරණය කරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව, සෑම රාජ්‍ය සේවකයකුටම වසරකට අනිවාර්ය අවම පුහුණු අවශ්‍යතා පැය ගණන කීය ද?

........................................................................................................................

**34.** සේවාලාභී ප්‍රඥප්තිය (Citizen Charter) යනු කුමක් ද?

........................................................................................................................

........................................................................................................................

**35.** රාජ්‍ය අංශයේ ආයතනවල ඵලදායිතාව ඇගයීමට ලක් කිරීමේ වගකීම ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතනය කුමක් ද?

........................................................................................................................

- ප්‍රශ්න අංක **36** සිට **50** දක්වා ප්‍රශ්නවලට සපයා ඇති කඩ රේඛාව මත පමණක් පිළිතුරු ලියන්න.

*(ලකුණු 03 × 15 = 45 යි)*

**36.** යහ පාලනයේ මූලිකාංග තුනක් ලියන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**37.** රටක යහ පාලනය තහවුරු වීමට නම් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී විය යුතු ප්‍රධාන අංශ **තුන** මොනවා ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**38.** කාර්යාල කළමනාකරණයේ දී වටිනා සම්පතක් ලෙස කාලය සැලකේ. අනෙකුත් සම්පත් හා සැසඳීමේ දී කාලය ට අදාළ අනන්‍ය ලක්ෂණ කවරේ ද? **තුනක්** සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**39.** ආයතන සතු සම්පත් අතර වඩාත් තීරණාත්මක වන්නේ මානව සම්පතයි. මෙම සම්පත තීරණාත්මක වීමට හේතු **තුනක්** දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**40.** "නිවසේ සිට සේවය (Work From Home) ක්‍රමය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට හඳුන්වා දීමේ දී මුහුණ දීමට සිදු වූ ප්‍රායෝගික දුෂ්කරතා **තුනක්** දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**41.** මාර්ගගත (On-line) සේවා සම්පාදනයේ නව ප්‍රවණතා ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට අත් විඳින්නට සිදු වූ අභියෝග **තුනක්** දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**42.** ශ්‍රව්‍ය- දෘශ්‍ය සම්මේලනය (Video Teleconferencing) ක්‍රමය රාජ්‍ය සේවයේ රැස්වීම් පැවැත්වීමේ දී භාවිත කිරීමේ ප්‍රධාන වාසි **තුනක්** සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**43.** ශ්‍රව්‍ය-දෘශ්‍ය සම්මේලන ක්‍රමය, රාජ්‍ය සේවයේ රැස්වීම් පැවැත්වීමට භාවිත කිරීමේ ප්‍රධාන අවාසි **තුනක්** සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**44.** රාජ්‍ය සේවයේ සේවා සැපයීම පිළිබඳ පොදු මහජනයා දැනුම්වත් කිරීමට නව තොරතුරු තාක්ෂණය යොදා ගත හැකි ක්‍රම වේද තුනක් නම් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**45.** වගවීම (Accountability) සංකල්පයේ මූලික ලක්ෂණ තුන කවරේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**46.** රාජ්‍ය සේවය තුළ දූෂණය (Corruption) යන්නෙහි අන්තර්ගත ප්‍රධාන ලක්ෂණ තුන කවරේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**47.** සේවක මණ්ඩල පුහුණු කිරීම ඔස්සේ සැලසෙන වාසි තුනක් දක්වන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**48.** කාර්යාලයක පිරි සැලැස්ම සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු තුනක් සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**49.** කඩදාසි රහිත ගොනු (Paperless Files) ගබඩා කිරීමේ දී භාවිත කරන දෘඩාංග තුනක් නම් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**50.** 'ඵලදායිතාව' ඉහළ නැංවීම ඔස්සේ ආයතනයක් තහවුරු කිරීමට අපේක්ෂා කරන මූලික සංකල්ප තුන කවරේ ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

***

Department of Examinations Sri Lanka